ජුලී ජේ. චංග් තානාපතිතුමිය
2013 පෙබරවාරි 13 වැනිදා, සඳුදා
තරුණ සංසද නායකත්ව සම්මේලනයේ දී පලකළ අදහස්

වනක්කම්. ආයුබෝවන්. අස්සලාම් අලෙයිකුම්. ශ්‍රී ලංකාවේ ජනාධිපති ගරු රනිල් වික්‍රමසිංහ මහතා, යාපනය, මහනුවර, මාතර හා කොළඹ තරුණ සංසද සාමාජිකයින්, ඇමෙරිකානු පියැසිවල සම්බන්ධීකාරකවරුන්, තානාපති කාර්යාලයේ මගේ සගයින්, සහ ඔබ හැමදෙනාටම සුභ උදෑසනක් වේවා.

ගරු වික්‍රමසිංහ ජනාධිපතිතුමනි, එ.ජ. තානාපති කාර්යාලයටත් ඇමෙරිකානු මධ්‍යස්ථානයටත් ඔබතුමා නැවත වරක් සාදරයෙන් පිළිගන්නවා. තරුණ සංසද සාමාජිකයිනි, ඔබේ නායකත්ව සම්මේලනයට ඔබ හැම සාදරයෙන් පිළිගන්නවා.

ඔබ පිළිබඳව වඩාත් අවබෝධ කරගැනීමටත්, තරුණ සංසදයේ ඔබේ සගයින් ගැන වඩාත් දැනගැනීමටත්, සහ ඉදිරි අනාගතයට දෑස් යොමු කර ඔබ නියෝජනය කරන ඇමරිකානු පියැසි ප්‍රජාව තුළ නායකයින් වශයෙන් ඔබ සංවර්ධනය කරන්නට කැමති වැඩසටහන් මොනවාදැයි තීරණය කරන්නටත් එලඹෙන දින කිහිපයේ ඔබ අභියෝගයට ලක් වේවි. ඔබ හැමදෙනාම සමගින් මෙහි එක්වන්නට ලැබීම සතුටක්!

ඔබ ශ්‍රී ලංකාවේ කුමන ප්‍රදේශයකින් පැමිණියත්, ඔබේ පරම්පරාවට අවශ්‍ය කරන්නේ සෞභාග්‍යමත් සහ ප්‍රජාතන්ත්‍රවාදී රටකට තමන්ගේ නිවහන කියා ඇමතීමටයි. ඔබට අවශ්‍ය උසස් අධ්‍යාපනයට සෑහෙන තරම් අවස්ථා ඇති, උද්යෝගීමත් සහ ප්‍රබෝධමත් වෘත්තීය ජීවිතයක් සඳහා සමාන අවස්ථා, සහ ශ්‍රී ලංකාවේ ජනතාව සහ විවිධ වූ සංස්කෘතික උරුමයේ සුන්දරත්වය පිළිබිඹු වන සාමකාමී ප්‍රජාවක් ඇති ශ්‍රී ලංකාවකුයි. මටත් අවශ්‍ය එයමයි! ශ්‍රී ලංකාව වත්මන් ආර්ථික අර්බුදයෙන් මුදාගෙන මූල්‍යමය වශයෙන් වඩාත් ස්ථාවර තත්වයකට ගෙන ඒම සඳහා සහ ප්‍රතිසන්ධානය සඳහා සිදුකරන ප්‍රතිසංස්කරණ සහ ගනුලබන ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් ගරු රනිල් වික්‍රමසිංහ ජනාධිපතිතුමා පසුගිය සතියේ අවධාරණය කළා. ජනාධිපතිතුමනි, රට නැවතත් යථා තත්වයට ගෙන ඒම සඳහා සහය දීමට එකමුතු වී ප්‍රජාතන්ත්‍රවාදී අන්දමින් ඉදිරියට යෑමට කටයුතු කරන මෙන් ඔබ ශ්‍රී ලාංකිකයින්ගෙන් ඉල්ලා සිටියා. තමන්ගේ රට දියුණුව කරා ඉදිරියට ගෙනයෑමට ශ්‍රී ලාංකික ජනතාවට ඇති අපේක්ෂාවට අපි සහය දෙනවා. ජනාධිපතිතුමනි, අප දෙරට අතර 75 වසරක ද්වීපාර්ශවීය සම්බන්ධතා තුළ, වඩාත් යහපත් ලොවක් ගොඩනැගීම සඳහා අප දරන සාමූහික වෑයම්වලදී එක්සත් ජනපදය ශ්‍රී ලංකාවේ සාඩම්බර හවුල්කරුවකු වී තිබෙනවා. ඔබ සඳහන් කළ ආකාරයට ශ්‍රී ලාංකික තාරුණ්‍යයේ හඬ, එනම් ඔබලාගේ තරුණ හඬ, ශ්‍රී ලංකාව සඳහා තමන්ට ඇති සිහින පිළිබඳ ලියූ තරුණතරුණියන්, ශ්‍රී ලංකාවේ අනාගතය සඳහා දායකත්වය ලබාදීමට විශිෂ්ට අදහස් ඇති තරුණ නායකයින් අද මේ

කාමරයට එක් රැස් වී සිටිනවා. මේ තරුණ පිරිස ශ්‍රී ලංකාවේ විවිධත්වය සම්පූර්ණයෙන් නියෝජනය කරනවා, ඔවුන්ගේ නායකත්ව ගමනට අපට සහයක් වන්නට හැකිවීම ගැන අපි බොහෝ ආඩම්බර වනවා. එනිසා, ඔබේ හඬවල් වැදගත් බවත් සාර්ථකව ඔබ වටා සර්වග්‍රාහී ලොවක් ගොඩනැගීමෙහි පදනම වන්නේ ඔබේ කැපවීම බවත් අද දිනයේ මෙහි සිටින ඔබ හැමදෙනා සිතට ගන්න.

ඒ සියල්ල ආරම්භ වන්නේ "ඔබ" සමගයි. ඔබේ අසල්වාසීන්, ඔබේ මිතුරන්, ඔබේ ආචාර්යවරුන්, මවුපියන්, ඥාතීන් වෙත ඔබ එළඹෙන ආකාරය අනුවයි. එය ඔබ එකිනෙකා සමගින් එකඟවන අවස්ථාවලට පමණක් නොව එකඟ නොවන අවස්ථාවලට ද එකසේ අදාළ වනවා. ඔබේ ප්‍රජාවන්ගේ අවශ්‍යතාවලට ඔබ ප්‍රතිචාර දක්වන්නේ කෙසේද, එකිනෙකා ලබන ජයග්‍රහණ ඔබ සමරන්නේ සහ බෙදාහදා ගන්නේ කෙසේද, සෑමවිටකම ඔබට අවශ්‍ය දෙය සිදුනොවුවත් ඔබ ඔවුන්ට සහය දෙන්නේ කෙසේද? නායකයකු වීම සඳහා ධෛර්යය අවශ්‍ය කරනවා. ඔබේම මාර්ගය සොයාගැනීමට සහ ඒ මාර්ගයේ ගමන් කිරීමට ධෛර්යය අවශ්‍යයි. ඇමෙරිකානු පියැසි සහ තරුණ සංසද ඔබේ නායකත්ව කුසලතා වර්ධනය කරගැනීම සඳහා වන සම්පතක්, මේ සතිය අවසානයේ ඔබ මේ නායකත්ව සම්මේලනයෙන් පිටත් වී යන්නේ තමන්ගේ අරමුණ ගැන අදහසක් සහ තමන් ගැන විශ්වාසයක් සහිතවයි කියා මා බලාපොරොත්තු වනවා.

ඔබ නොදන්නවා වුනත්, මාත් එක්තරා කාලයක ලජ්ජාශීලී සිසුවියක් වී සිටියා. මගේ පවුල කොරියාවේ සිට එක්සත් ජනපදයට සංක්‍රමණය වූයේ මට වයස අවුරුදු පහේදීයි.  මා එතැනට අයත් නැති බවක් මට දැනුනා. ඒ තත්වයේ වෙනසක් ඇතිවන්නට ගත්තේ මට වයස අවුරුදු 14දීයි. මාගේ පාසලේ සහතිකපත් ප්‍රදානෝත්සවය දිනයේ කථාව පවත්වන්නට අවස්ථාව ජයග්‍රහණය කරගැනීම සඳහා කථා ලිවීමේ තරඟයකට ඇතුළුවන්නට මා තීරණය කළා. මගේ කථාව මා සකස් කලේ  විට්නි හූස්ටන්ගේ “Greatest Love of All” ගීතය පදනම් කරගෙනයි. ඔබලා අතරින් ඇතැම් අය ඒ ගීතය දන්නවා ඇති. එහි මෙසේ කියනවා:

*I believe the children are our future*
*Teach them well and let them lead the way*
*Show them all the beauty they possess inside*
*Give them a sense of pride to make it easier*
*Let the children's laughter remind us how we used to be*

*(දරුවන් අපේ අනාගතය කියා විශ්වාස කරමි*

*ඔවුන්ට හොඳින් උගන්වා නායකත්වය ගන්නට ඉඩ දෙමු*

*ඔවුන් තුළ ඇති සුන්දරත්වය ඔවුන්ට පෙන්වා දෙමු*

*තමන් ගැන ආඩම්බරයක් ඇති කරදෙමු*

*ළමයින්ගේ සිනහව තුළින් අපේ අතීතය දකිමු)*

මට වුවමනා කළේ වැඩිහිටියන් අපේ පරම්පරාවට සවන් දෙන්නට යොමුකරගැනීමටත් ලෝකය වෙනස් කරන්නට අපට ඇති හැකියාව ඔවුන්ට අවබෝධ කරදෙන්නටත් නිසා මා ඒ ගීතය තෝරාගත්තා. මා එම කථික තරඟයෙන් ජයගෙන, සහතික ප්‍රදානෝත්සවයේ කථාව පැවැත්වූවා. මගේ නායකත්ව ගමනේදී මට උදවු වූ මුල් කාලීන ජයග්‍රහණයක් ලෙස එය හඳුන්වන්න පුළුවනි.

නායකයකු වීම ජය පරාජය දෙකම සහිත ගමනක් බව ඔබ දන්නවා. මේ සම්මේලනය හරහා, සහ තරුණ සංසද හරහා අප උත්සාහ කරන්නේ ඔබේම අනාගතයක් සඳහා, ඔබේම මාර්ග සිතියමක් සකසා ගන්නට අවශ්‍ය මෙවලම් ඔබට ලබාදීමටයි. කිසිදු ගැටලුවකින් තොරව මේ ගමන යන්නට ඔබට හැකිවෙතැයි සහතික වන්නට මට හැකිනම් කොතරම් හොඳදැයි මා සිතුවත්, සැබෑව නම්, ඇතැම් අවස්ථාවලදී ඔබ විවිධ විපත්වලට, හෝ ජීවිතයේ දුෂ්කර අභියෝගවලට මුහුණ දේවි. නමුත්, ඔබට හොඳ දැනුමකින්, ශක්තිමත් උපකාරක පද්ධතියකින් ඔබ සන්නද්ධ නම්, සහ ඔබේ අවංකත්වය සහ කුතුහලය නොවෙනස්ව පවත්වාගෙන යන්නේ නම්, අරමුණක් ඇතිව වැඩකරන්නේ නම්, නායකයකු ලෙස ඔබ ජයග්‍රහණය කරන බව සහතිකයි. මේ සතියේ ඉදිරිපත් කිරීම් සිදුකරන අයගෙන් සහ එකිනෙකාගෙන් ඉගෙන ගන්නට මේ සතිය ගත කරන මෙන් සහ එකිනෙකාට සහය ලබාදීමටත් තමන්ගේ සිහින පසුපස හඹා යෑමටත් සූදානම් වී මේ ස්ථානයෙන් පිටවන ලෙස මා ඔබෙන් ඉල්ලා සිටිනවා.

මේ ඇමෙරිකානු මධ්‍යස්ථානය සේම ශ්‍රී ලංකාවේ විවිධ ස්ථානවල පිහිටා ඇති අනෙකුත් ඇමෙරිකානු පියැසි අපගේ සිහින වෙනුවෙන් ඇතිකළ ඒවායි. ශ්‍රී ලංකාව සමගින් අපගේ ද්වීපාර්ශවීය සබඳතා ඇති කරගෙන 75 වැනි වර්ෂය සමරන මේ වසරේ ශ්‍රී ලංකාව තම 75 වැනි නිදහස් සංවත්සරය සමරනවා. තරුණ නායකයින්ට ඒකරාශී වීමට සහ සිහින දැකීමට අවකාශයක් සලසා දීමට එක්සත් ජනපදය කවදත් කටයුතු කර තිබෙනවා. අපගේ ඇමෙරිකානු පියැසි සැලසුම් කර ඇත්තේම ඒ සඳහායි. මෙහි අප අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස සමරනවා, තොරතුරු කරා මෙහි නොමිලයේ ප්‍රවේශ විය හැකියි, සමාගමයේ නිදහසට මෙහි සහය දෙනවා. දැන්, ඔබට ස්තුති වන්නට තරුණ වැඩිහිටියන් තමන්ගේ සර්වග්‍රාහී නායකත්ව කුසලතා ඔප් නංවාගෙන අපගේ ප්‍රජාවන්ගේ අවශ්‍යතා සපුරාලන විසඳුම් නිර්මාණය කරන තරුණ සංසද සම්බන්ධයෙන් ද අපෙගේ ඇමෙරිකානු පියැසි ප්‍රසිද්ධ වී තිබෙනවා.

කොළඹට පැමිණීම වෙනුවෙන්, තරුණ සංසද සඳහා ඔබේ කාලය කැපකිරීම වෙනුවෙන් ස්තුතියි. දැන් මම ගරු ජනාධිපතිතුමාට එතුමාගේ අදහස් දැක්වීම සඳහා ගෞරවයෙන් ආරාධනා කරනවා.